# අනුරාධපුර අවධියෙහි ව්‍යාප්ත වූ සාගත හා වසංගත තත්ත්වයන්වලදී මානව සමාජ ක්‍රියාකාරිත්වයෙහි ස්වභාවය පිළිබඳ විමර්ශනයක්

ආර්.ජේ.ටී.එම්. ජයතිලක[1]

පුරාතනයේ දී ලංකාවේ ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වයත් ආගමික අඛණ්ඩතාවත් සමාජ ස්වස්තතාවත් අඩාල කරමින් විවිධ සාගත හා වසංගත උත්පන්න විය . අනුරපුර සමයේ දී එවැනි සාගත හා වසංගතවල දී තත්කාලීන මානව සමාජයේ හැසිරීම විමර්ශනය මෙහි දී සිදුවේ. පුස්තකාල පරිශීලනය මගින් ප්‍රාථමික හා ද්විතික මූලාශ්‍රය අධ්‍යයනය මූලික ක්‍රමවේදය ලෙස යොදා ගැනුණි. අනුරාධපුර අවධියෙහි උත්පන්න පළමු සාගතය බුලු කෑ සාය විය. නිසි වර්ෂාව නොලැබීමත් නොදියුණු ධාන්‍ය ප්‍රවාහනයත් නිසා කොත්මලේ කඳුකරයෙහි සීඝ්‍රයෙන් පැතිරුණු සාගතයෙහි නිමාව පැතීමට දුටුගැමුණු රජු කුණ්ඩලාභරණ දෙකක් විකුණා සංඝයාට දන් පිළිගැන්වීය. වට්ටගාමිණී රාජ්‍ය කල උපන් බැමිණිතියා සාගතයේදී ඇතැම් භික්ෂූහු ථේරවාදය රක්ෂණයට විදේශගත වුවත් ඇතැම්හු ගස්වල කොළ ගෙඩි කමින් ධර්මය වනපොත් කළහ. ආහාර අර්බුදය හමුවේ මනුෂ්‍යයෝ දිවි රැකගැනීමට මියැදුණු පුද්ගලයන්ගේ මාංශ පවා අනුභව කළහ. කුඤ්චනාග රාජ්‍ය කල ඇතිවූ එක්නැලි සෑය නම් සාගතයෙහි දී මනුෂ්‍යයෝ දිවි රැකගැනීමට නැලියක තරම් ස්වල්ප ධාන්‍ය කොටසකින් යැපුනහ. සිරිසංඝබෝධි රජු කල උත්පන්න රක්තාක්ෂි උවදුර නම් වසංගතයේ දී රජු රුවන්වැලි චෛත්‍ය මළුවෙහි හිඳ සත්‍යක්‍රියා කළ පසු වර්ෂාව පතිතව දුර්භික්ෂය නිමවිය. 1 වැනි උපතිස්ස රාජ්‍ය කල ඇතිවූ නියඟයේ දී භික්ෂූහු රැයක් පුරා අනුරපුර වීථීන්හි සැරිසරමින් රතන සූත්‍රය සජ්ඣායනා කළ පසු වර්ෂාව ඇතිවිය. ස්වස්ථතාව පමුණුවා ගැනීමේ ආධාරකයක් ලෙස පිරිත ගෞරවයට පාත්‍ර වූ වග එමගින් විදර්ශිතය. ෂඪ වැනි උදය රජු කල උපන් නියඟයේදී රජු දානශාලා ඉදිකර භික්ෂූන්ට ආහාරපාන සැපයීය. තවත් නියඟයකදී ශිලාමේඝවර්ණ රජු ද භික්ෂූන්ට දන් දුන්නේය. එපරිද්දෙන් අනුරපුර යුගයෙහි උපන් සාගත හා වසංගතයන් පිළිබඳ විමසීමේදී පෙනෙන්නේ මිනිසුන් බොහෝවිට ආධ්‍යාත්මික පිළිසරණයන් පැතූ බවයි. භික්ෂූන්ට සිව්පසය පිළිගැන්වීම, පිරිත් සජ්ඣායනය, සත්‍යක්‍රියා කිරීම, ආරාම හා දන්හල් පූජාකිරීම ආදී ආගමික පිළිවෙත් සමාජ සුබසෙත තහවුරුකරලීමේ ඇදහිලි විශ්වාසයන් ලෙස ක්‍රියාත්මක වූ බව පැහැදිළිය. ඇතැම්විට ගිහියන් ධර්මයට විරුද්ධව ගියත් භික්ෂූන් ධර්ම ආරක්ෂණයටම කැපවූ අතර භව විමුක්තිය උදෙසා ගිහි-පැවිදි විශමතාව එමගින් හොඳින් ප්‍රදර්ෂිතය. සමාජ උවදුරුවලදී සුබගමනය තහවුරු කිරීම භික්ෂූන්ගේත් රාජකීයන්ගේත් ප්‍රධාන වගකීමක් වූ බව මැනවින් පැහැදිලිය.

**ප්‍රමුඛ පද :** ස්වස්තතාව, සාගතය, වසංගතය, රජු, භික්ෂූන්

[1] මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. *thilinamjayathilaka@gmail.com*